# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1766/5 — 2012 ජූලි මස 11 වැනි බදාදා - 2012.07.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### වයඹ පළාතේ පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 වගන්තිය යටතේ කරනුලබන නිවේදනයයි.

වයඹ පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා වයඹ පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, ඉඩම්, ප්‍රවාහන, පරිසර, සංචාරක ආයෝජන, සම්බන්ධීකරණ, සමුපකාර සංවර්ධන සහ ආහාර සැපයුම් විෂයභාර අමාත්‍ය විජේසිංහ හෙට්ටිඅච්චි මුදියන්සේලාගේ අතුල සරත් කුමාර විජේසිංහ වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ දෙවැනි වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පත්කරන්නට යෙදුණු විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු ඕ. ඩබ්. ඕ. බී. වීරසේන මහතාගෙන් සැදුම්ලත් ඒක පුද්ගල පරීක්ෂණ කොමිෂන් සභා විසින් පහත චෝදනාවල සඳහන් වැරදි ක්‍රියා හේතුකොටගෙන සේනානායක මුදියන්සේලාගේ බන්දුල පුෂ්පකුමාර සේනානායක මහතා විසින් මහව ප්‍රාදේශීය සභාවේ "සභාපති" ධුරයේ කටයුතු කිරීමේදී ඉහත කී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 වගන්තියේ (1) වැනි උපවගන්තියෙහි සඳහන් වැරදි ක්‍රියා සිදුකර ඇත්ද යන්න පරීක්ෂා කරන ලදී.

**එසේ පරීක්ෂා කරන ලද චෝදනා නම් :**

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍ර අංක 1717/18 හා 2011.08.03 දින දරන ගැසට් නිවේදනයේ සඳහන් චෝදනා :*

(i) 2011 අප්‍රේල් මස 01 වැනි දින හෝ ඊට ආසන්න දිනයක සිට මේ දක්වා මහව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් සිටියදී මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඉදිකර ඇති ගොඩනැගිලි සම්බන්ධයෙන් වූ ගොඩනැගිලි අයදුම්පත්‍ර අනුමත කිරීමේදී වීථිරේඛා සහතික නිකුත් කිරීම වෙනුවෙන් 2011.05.03 වැනි දින හෝ ඊට ආසන්න දිනයක දී මහව ප්‍රාදේශීය සභාවේ ලදුපත් අංක 79488 මගින් රුපියල් එක්දහස් නවසිය පනස් පහක (රු. 1,955.00) ක මුදලක් අටවරල මහව පදිංචි එම්. ටී. ජලීල් යන අයගෙන් වයඹ පළාත් පාලන කොමසාරිස්ගේ 2010.07.27 වැනි දිනැති ප.පා.කො/චක්‍රලේඛ අංක 1/2010 උපදෙස්වලට පටහැනිව අය කිරීමට කටයුතු කිරීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (1)(අ) හා/හෝ 185(1)(ඈ) වගන්තියේ/වගන්තිවල සඳහන් වරද/වැරදි සිදු කිරීම.

(ii) 2011 අප්‍රේල් මස 01 වැනි දින සිට හෝ ඊට ආසන්න දිනයක සිට 2011.06.24 වැනි දින හෝ ඊට ආසන්න දිනයක් දක්වා මහව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් සිටිය දී මහව ප්‍රාදේශීය සභාවට අවශ්‍ය ලිපිද්‍රව්‍ය සඳහා 2011.04.21 හෝ ඊට ආසන්න දිනයක දී අංක 435 දරන ගෙවීම් වවුචරය මගින් මහව ප්‍රාදේශීය සභාවේ පොදු අරමුදලින් රුපියල් විසිදෙදහස් දෙසිය හතලිස් පහක (රු. 22,245.00) මුදලක් ප්‍රාදේශීය සභාවේ විධිමත් සභා සම්මතයකින් හා ටෙන්ඩර් කැඳවීමකින් තොරව මහව ලිපිනයේ කේ. එම්. අරුණ පුෂ්කුමාර යන අයට ලබාදීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 174 වැනි වගන්තියට පටහැනිව ක්‍රියා කිරීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(1)(අ) හා/හෝ 185(1)(ආ) හා/හෝ 185(1) (ඉ) වගන්තියේ/වගන්තිවල සඳහන් වරද/වැරදි සිදුකිරීම.

(iii) 2011 අප්‍රේල් මස 01 වැනි දින සිට හෝ ඊට ආසන්න දිනයක සිට 2011.06.24 වැනි දින හෝ ඊට ආසන්න දිනයක් දක්වා මහව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් සිටිය දී මහව ප්‍රාදේශීය සභාවේ අඹන්පොල පෙර පාසලේ දීමනා මත සේවයේ නියුතු අයි. එම්. එස්. කේ. හේරත් යන පෙර පාසල් පාලිකාව 2011.03.01 වැනි දින සිට 2011.04.27 දින දක්වා සේවයට වාර්තා නොකර තිබිය දී එම කාල සීමාවට අදාලව 2011.05.10 මහව ප්‍රාදේශීය සභාවේ පොදු අරමුදලින් වවුචර අංක 564 මගින් රුපියල් හාරදහස් හයසීයක් (රු. 4,600.00) ක් හෝ ඊට ආසන්න මුදලක් දීමනාවක් ලෙස 2011.05.10 හෝ ඊට ආසන්න දිනයකදී ප්‍රදානය කිරීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 184 වැනි වගන්තිය යටතේ පනවන ලද මුල්‍ය හා පරිපාලන රීති 103හි සඳහන් විධිවිධානයන් අනුගමනය නොකර ගෙවීම් කිරීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(1)(අ) හා/හෝ 185(1)(ඈ) 185(1)(ඉ) වගන්තියේ/වගන්තිවල සඳහන් වරද/වැරදි සිදු කිරීම.

(iv) 2011 අප්‍රේල් මස 01 වැනි දින සිට හෝ ඊට ආසන්න දිනයක සිට මේ දක්වා මහව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් සිටියදී මහව ප්‍රාදේශීය සභාවේ දීමනා මත අයි. එම්. එස්. කේ. හේරත් මිය, එල්. එස්. රේණුකා දමයන්ති මිය, ආර්. එම්. මල්ෂා හර්ෂණී මිය පෙර පාසල් පාලිකාවන් ලෙස හා මාලා එස්. ටිකිරි කුමාරි මිය පරිගණක ක්‍රියාකරු ලෙස බඳවා ගෙන දීමනා ගෙවීමේදී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(1)(i) වගන්තියට පටහැනිව ක්‍රියා කිරීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(1)(අ) හා/හෝ 185(1)(ආ) හා/හෝ 185(1)(ඉ) වගන්තියේ/වගන්තිවල සඳහන් වරද/වැරදි සිදු කිරීම.

(v) 2011 අප්‍රේල් මස 01 වැනි දින සිට හෝ ඊට ආසන්න දිනයක සිට මේ දක්වා මහව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් සිටියදී සභාවට පැමිණි ප්‍රභූන්ට සංග්‍රහ කටයුතු සඳහා මහව ප්‍රාදේශීය සභාවේ විධිමත් සභා සම්මුතියකින් තොරව හා 1989 අංක 12 දරන පළාත් සභා ආනුෂංගික විධිවිධාන පනතේ දෙවැනි වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තිය යටතේ වයඹ පළාතේ විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතියකින් තොරව මහව හොටෙල් ශාන්ති ආයතනයට 2011 අප්‍රේල් මස 07 වැනි දින හෝ ඊට ආසන්න දිනයක දී මහව ප්‍රාදේශීය සභාවේ පොදු අරමුදලින් රුපියල් විසිදහස් අටසිය විසි හතක (රු. 20,827.00) මුදලක් ගෙවීමට සැලැස්වීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(1)(අ) හා/හෝ 185(1)(ආ) හා/හෝ 185(1)(ඉ) වගන්තියේ/වගන්තිවල සඳහන් වරද/වැරදි සිදුකිරීම.

(vi) 2011 අප්‍රේල් මස 01 වැනි දින සිට හෝ ඊට ආසන්න දිනයක සිට මේ දක්වා මහව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් සිටිය දී, 2011 අප්‍රේල් මස 25 වැනි දින හෝ ඊට ආසන්න දිනයක දී අංක 68, මැලිබන් වීදිය, කොළඹ 11, සේසත් ඉලෙක්ට්‍රික් කම්පැණි ආයතනයට මහව ප්‍රාදේශීය සභාවේ විධිමත් සභා සම්මතයකින් තොරව මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වීථි පහන් අලුත්වැඩියා කිරීමට ලබාගත් විථි පහන් උපකරණ සැපයීම වෙනුවෙන් මහව ප්‍රාදේශීය සභා පොදු අරමුදලින් රුපියල් තිස්අට දහසක (රු. 38,000.00) මුදලක් ගෙවීමට කටයුතු කිරීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(1)(අ) හා/හෝ 185(1)(ආ) හා/හෝ 185(1)(ඉ) වගන්තියේ/වගන්තිවල සඳහන් වරද/වැරදි සිදු කිරීම.

(vii) 2011 අප්‍රේල් මස 01 වැනි දින සිට හෝ ඊට ආසන්න දිනයක සිට මේ දක්වා මහව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් සිටිය දී 2011.06.01 දින හෝ ඊට ආසන්න දිනයක දී අංක 68, මැලිබන් වීදිය, කොළඹ 11, සේසත් ඉලෙක්ට්‍රික් කම්පැණි ආයතනයට මහව ප්‍රාදේශීය සභාවේ විධිමත් සභා සම්මතයකින් තොරව හා 2011.03.01 වැනි දින ටෙන්ඩර් මණ්ඩල නිර්දේශයට පටහැනි ලෙස මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වීථි පහන් අලුත්වැඩියා කිරීමට ලබාගත් වීථි පහන් උපකරණ සැපයීම වෙනුවෙන් මහව ප්‍රාදේශීය සභා පොදු අරමුදලින් රුපියල් හතලිස් හයදහස් එකසිය හතලිස් හයයි ශත විසි පහ (රු. 46,146.25)ක මුදලක් ගෙවීමට කටයුතු කිරීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(1)(අ) හා/හෝ 185(1)(ආ) හා/හෝ 185(1)(ඉ) වගන්තියේ/වගන්තිවල සඳහන් වරද/වැරදි සිදු කිරීම.

(viii) 2011 අප්‍රේල් මස 01 වැනි දින සිට හෝ ඊට ආසන්න දිනයක සිට මේ දක්වා මහව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් සිටියදී 2011.04.26 වැනි දින හෝ ඊට ආසන්න දිනයක දී ආර්. එම්. එල්. කේ. රාජපක්ෂ යන අයට මහව ප්‍රාදේශීය සභාවේ විධිමත් සභා සම්මතයකින් තොරව බලල්ල මහජන පුස්තකාලය සහ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා වූ සැළසුම් ඇඳීම සහ ඇස්තමේන්තු සකස් කිරීම සඳහා මහව ප්‍රාදේශීය සභා පොදු අරමුදලින් රුපියල් හැත්තෑ හය දහස් හාරසිය හැත්තෑ පහක (රු. 76,475.00) මුදලක් ගෙවීමට කටයුතු කිරීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(1)(අ) හා/හෝ 185(1)(ආ) හා/හෝ 185(1)(ඉ) වගන්තියේ/වගන්තිවල සඳහන් වරද/වැරදි සිදු කිරීම.

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍ර අංක 1720/7 හා 2011.08.24 දින දරන ගැසට් නිවේදනයේ සඳහන් චෝදනා :*

(i) 2011 අප්‍රේල් මස 01 වැනි දින සිට හෝ ඊට ආසන්න දිනයක සිට මහව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් සිටියදී 2011.06.23 දින හෝ ඊට ආසන්න දිනයක දී මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වීථි පහන් අලුත්වැඩියා කිරීම සඳහා වීථි පහන් උපකරණ සැපයීම වෙනුවෙන් මහව ප්‍රාදේශීය සභාවේ විධිමත් සභා සම්මුතියකින් තොරව වවුචර් පත්‍ර 624 මගින් කොළඹ 11, මැලිබන් වීදිය, අංක 68 ලිපිනයෙහි ''සේසත් ඉලෙක්ට්‍රිකල් කම්පැනි '' ආයතනයට මහව ප්‍රාදේශීය සභා පොදු අරමුදලින් රුපියල් 46,275ක මුදලක් හෝ ඊට ආසන්න මුදලක් ගෙවීමට කටයුතු කිරීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (1)(අ) හා/හෝ 185(1)(ආ) හා/හෝ 185(1)(ඉ) වගන්තියේ/වගන්තිවල සඳහන් වරද/වැරදි සිදු කිරීම

(ii) 2011 අප්‍රේල් මස 01 වැනි දින සිට හෝ ඊට ආසන්න දිනයක සිට මහව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් 2011.07.26 හෝ ඊට ආසන්න දිනයක දී මහව ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ සහකාර/වැඩ බලන ලේකම් අයි. එම්. ස්වර්ණතිලකා යන අයගේ රාජකාරියට බාධාවන පරිදි ක්‍රියා කිරීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(1)(අ) හා/හෝ 185(1)(ආ) හා/හෝ 185(1) (ඉ) වගන්තියේ/වගන්තිවල සඳහන් වරද/වැරදි සිදුකිරීම

(iii) 2011 අප්‍රේල් මස 01 වැනි දින සිට හෝ ඊට ආසන්න දිනයක සිට මහව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් 2011.07.26 දින හෝ ඊට ආසන්න දිනයක දී මහව ප්‍රාදේශීය සභාවේ කළමනාකරණ සහකාර/වැඩ බලන ලේකම් අයි. එම්. ස්වර්ණතිලකා යන අයට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 219(i) වගන්තිය යටතට ගැනෙන මූල්‍ය සම්බන්ධතාවක් වෙනුවෙන් ප්‍රාදේශීය සභා පොදු අරමුදලින් ගෙවීම් කිරීමට පූර්ව අවශ්‍යතා සම්පූර්ණ නොකර තිබිය දී විධානය කිරීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(1)(අ) හා/හෝ 185(1)(ආ) හා/හෝ 185(1)(ඉ) වගන්තියේ/වගන්තිවල සඳහන් වරද/වැරදි සිදු කිරීම.

(iv) 2011 අප්‍රේල් මස 01 වැනි දින සිට හෝ ඊට ආසන්න දිනයක සිට මහව ප්‍රාදේශීය සභාවේ සභාපති වරයා වශයෙන් කටයුතු කරමින් මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වීථි පහන් අලුත්වැඩියා කිරීම සඳහා විදුලි බන්ඩල් කේබල් 100ක් සැපයීම වෙනුවෙන් සංඝරාජ මාවත, කොළඹ 10, කොලෝනියල් ඉලෙක්ට්‍රිකල් ඉක්විප්මන්ට් ආයතනයෙන් රුපියල් 29,500ක බිල් පතක් මහව ප්‍රාදේශීය සභාවේ සභාපති නමට ඉදිරිපත් කර තිබියදී ''කොලෝනියල් ඉලෙක්ට්‍රිකල් ඉක්විප්මන්ට්'' ආයතනයට මහව ප්‍රාදේශීය සභා පොදු අරමුදලින් ගෙවීම් සිදු නොකර මහව ප්‍රාදේශීය සභාවේ රියදුරු කේ. එම්. අරුණ පුෂ්ප කුමාර යන අයට 2011.04.26 දින හෝ ඊට ආසන්න දිනයක දී වවුචර් අංක 436 මගින් රුපියල් 29,500ක මුදලක් ගෙවීමට කටයුතු කිරීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 219(1) වගන්තියට යටතට ගැනෙන මූල්‍ය සම්බන්ධතාවක් වෙනුවෙන් ප්‍රාදේශීය සභා පොදු අරමුදලින් ගෙවීම් කිරීමට කටයුතු කිරීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(1)(අ) හා/හෝ 185(1)(ආ) හා/හෝ 185(1)(ඉ) වගන්තියේ/වගන්තිවල සඳහන් වරද/වැරදි සිදු කිරීම.

(v) 2011 අප්‍රේල් මස 01 වැනි දින සිට හෝ ඊට ආසන්න දිනයක සිට මහව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් සිටියදී 2011.07.13 වැනි දින හෝ ඊට ආසන්න දිනයක දී මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වීථි පහන් අලුත්වැඩියා කිරීම සඳහා විධිමත් ටෙන්ඩර් කැඳවීමකින් තොරව වීථි පහන් උපකරණ සැපයීම සඳහා කොළඹ 11, මැලිබන් වීදිය, අංක 68 ලිපිනයෙහි ''සේසත් ඉලෙක්ට්‍රිකල් කම්පැනි '' ආයතනයට රුපියල් 1,43,850ක මුදලක් හෝ ඊට ආසන්න මුදලක් ගෙවීමට සැලැස්වීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 174 වැනි වගන්තියට පටහැනිව ක්‍රියා කිරීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(1)(අ) හා/හෝ 185(1)(ආ) හා/හෝ 185(1)(ඉ) වගන්තියේ/වගන්තිවල සඳහන් වරද/වැරදි සිදුකිරීම.

(vi) 2011 අප්‍රේල් මස 01 වැනි දින සිට හෝ ඊට ආසන්න දිනයක සිට මහව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් සිටිය දී, 2011.07.13 වැනි දින හෝ ඊට ආසන්න දිනයක දී මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වීථි පහන් අලුත්වැඩියා කිරීම සඳහා වීථි පහන් උපකරණ සැපයීම වෙනුවෙන් මහව ප්‍රාදේශීය සභාවේ විධිමත් සභා සම්මුතියකින් තොරව වවුචර් පත්‍ර අංක 741, 742, 743 සහ 744 මගින් කොළඹ 11, මැලිබන් වීදිය, අංක 68 ලිපිනයෙහි ''සේසත් ඉලෙක්ට්‍රිකල් කම්පැනි '' ආයතනයට මහව ප්‍රාදේශීය සභා පොදු අරමුදලින් රුපියල් 1,43,850ක මුදලක් හෝ ඊට ආසන්න මුදලක් ගෙවීමට කටයුතු කිරීමෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(1)(අ) හා/හෝ 185(1)(ආ) හා/හෝ 185(1)(ඉ) වගන්තියේ/වගන්තිවල සඳහන් වරද/වැරදි සිදු කිරීම.

මහව ප්‍රාදේශීය සභාවේ සභාපති, සේනානායක මුදියන්සේලාගේ බන්දුල පුෂ්පකුමාර සේනානායක මහතාට එරෙහිව ඉහත සඳහන් චෝදනා පරීක්ෂා කරනලද විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු ඕ. ඩබ්. ඕ. බී. වීරසේන මැතිතුමාගෙන් සැදුම්ලත් ඒක පුද්ගල පරීක්ෂණ වාර්තා අනුව ඉහතින් සඳහන් කරන්නට යෙදී ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1717/18 හා 2011.08.03 දින දරන *(අති විශෙෂ) ගැසට් පත්‍රයට* ඇතුලත් ii, iv, v, vi, vii, viii යන චෝදනාවන්ට මහව ප්‍රාදේශීය සභාවේ සභාපති සේනානායක මුදියන්සේලාගේ බන්දුල පුෂ්පකුමාර සේනානායක මහතා වැරදිකරු බවටත් එමෙන්ම i, iii යන චෝදනාවන්ට මහව ප්‍රාදේශීය සභාවේ සභාපති සේනානායක මුදියන්සේලාගේ බන්දුල පුෂ්පකුමාර සේනානායක මහතා නිවැරදිකරු බවටත් නිගමනය කර ඇත. එමෙන්ම ඉහතින් සඳහන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1720/7 හා 2011.08.24 දින දරන *(අති විශෙෂ) ගැසට් පත්‍රයට* ඇතුලත් i, ii. iii, iv, v, vi යන චෝදනාවන්ට මහව ප්‍රාදේශීය සභාවේ සභාපති සේනානායක මුදියන්සේලාගේ බන්දුල පුෂ්පකුමාර සේනානායක මහතා වැරදිකරු බවටත් නිගමනය කර ඇත.

අදාල සියළුම චෝදනා සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති සාක්ෂි හා ඒක පුද්ගල පරීක්ෂණ කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කර ඇති නිගමන පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කිරීමෙන් පසු එම නිගමන සමග මම පෞද්ගලිකව සෑහීමකට පත්වෙමි.

ඒ අනුව සේනානායක මුදියන්සේලාගේ බන්දුල පුෂ්පකුමාර සේනානායක මහතා මහව ප්‍රාදේශීය සභාවේ සභාපති ලෙස කටයුතු කිරීමේදී ඉහත සඳහන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1717/18, හා 2011.08.03 දිනැති *(අති විශෙෂ) ගැසට් පත්‍රයේ* සඳහන් ii, iv, v, vi, vii, viii යන චෝදනාවන් හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1720/7 හා 2011.08.24 දින දරන *(අති විශෙෂ) ගැසට් පත්‍රයේ* සඳහන් i, ii. iii, iv, v, vi යන චෝදනාවලට අදාල වැරදි ක්‍රියා සිදුකිරීම හේතුකොටගෙන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (1) උපවගන්තියේ සඳහන් 185(1)අ, 185(1)ආ, 185(1)ඇ, 185(1)ඈ, 185(1)ඉ වගන්තිවල සඳහන් වැරදි ක්‍රියා සිදුකර ඇති බවට මම සෑහීමකට පත්වෙමි.

එසේ සෑහීමකට පත්වීමෙන් පසු 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ දෙවැනි වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185(1), (1) වැනි උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2012 ජූලි මස 10 දින සිට ක්‍රියාත්මකවන පරිදි සේනානායක මුදියන්සේලාගේ බන්දුල පුෂ්පකුමාර සේනානායක මහතා මහව ප්‍රාදේශීය සභාවේ විධායක නිළධාරි ධුරය වන "සභාපති" ධුරයෙන් ඉවත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

අතුල සරත් කුමාර විජේසිංහ,<br>
වයඹ පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ<br>
මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන හා<br>
පළාත් පරිපාලන, මිනිස්බල, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු,<br>
ඉඩම්, ප්‍රවාහන, පරිසර, සංචාරක ආයෝජන, සම්බන්ධීකරණ,<br>
සමූපකාර සංවර්ධන හා ආහාර සැපයුම් විෂයභාර අමාත්‍ය.

2012 ජූලි මස 10 වැනි දින,<br>
කුරුණෑගල ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

07 - 721

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.